
# 17
# ව්‍යසන මැද



ජන සමාජයක් ව්‍යසනයන්ට මැදි වූ විට එයට විවිධ ප්‍රතිචාර දක්වයි. ව්‍යසන නිසා මිනිස් ලෝකයට අර්බුදකාරී හා අභියෝගාත්මක අවස්ථා මැදින් ගමන් කරන්නට සිදු වේ. අපට මුහුණ දීමට සිදු වන ව්‍යසන මොනවා ද?

1. මිනිසා විසින් ම නිර්මාණය කරන ලද ඒවා
2. ස්වාභාවික ව්‍යසන

උදාහරණයක් වශයෙන් යුද්ධය මිනිසාගේ නිර්මාණයක් වන අතර සුනාමි උදම් රළ ස්වාභාවික ව්‍යසනයකි. එසේ ම සමහර ව්‍යසන මිනිස් දැනුම ඉක්මවා යයි. ශ්‍රී ලාංකික ජන සමාජය මෑත කාලීන ව විවිධ ස්වාභාවික ව්‍යසනවලට මුහුණ දුන්හ. ගංවතුර, නියඟය, නායයෑම, හා සුනාමි උදම් රළ ඉන් සමහරකි. සුනාමිය නිසා ආසන්න වශයෙන් පුද්ගලයින් 40000 කට පමණ ලංකාව තුළ ජීවිත අහිමි විය. දේපළ අලාභහානි, පරිසර හානි, පෞරුෂත්ව බිඳ වැටීම , ආර්ථික ගමන් වේගය පහළ බැසීම වැනි බොහෝ දේ ඒ හා අනුබද්ධිත ව සිදු විය.

ස්වාභාවික ව්‍යසන සිදු වන විට මිනිස්සු බොහෝ විට තමන්ගේ ඇදහිල්ල හා ආගමික විශ්වාසයන් ප්‍රශ්න කරති. දෙවි කෙනෙකු සිටී ද? මෙය සිදු වුයේ ඇයි? මෙය දේව කැමැත්ත ද? වැනි නොයෙක් ආකාර ප්‍රශ්න නගති. " මේ පාඩම තුළ දී ස්වාභාවික ව්‍යසන දෙසට අපි වඩාත් නැඹුරු වෙමු.

( ඒ ගැන සාකච්ඡාවක් ඇති කරන්න )

## 1. දෙවියන් වහන්සේ හා මැවිල්ල

- **මැවිල්ල අවසානයේ දී මුළු, විශ්වය ම මනහර බව දෙවියන් වහන්සේ දුටුසේක.**

උත්පත්ති 1 : 31

මේ ස්වාභාවික ලෝකයේ වැසි චක්‍රය පාරිසරික සමතුලිතභාවය සහිත තවත් බොහෝ දේ මැවීමේ දී දෙවිඳුන්ගේ සැලැස්ම තුළ ලෝකයේ මනහර භාවය සහිත ව මැවූ බව ප්‍රකාශ කරයි. එසේ නම් එතුමන් තම මැවිල්ලට ප්‍රේම කරන බව සහතික ය. ස්වාභාවික ලෝකයේ ව්‍යසනය එතුමන්ගේ කැමැත්ත විය නොහැකි ය.

- **මැවිල්ල පීඩා විඳින විට දෙවිඳුන් දුක් වන බව**

රෝම 8 : 26 , යෙසායා 64 : 9 ශු. ලූක් 19: 41 42 , යෙසායා 16 : 11
ජෙරමියා 48 : 31
ජොහාන් 11 : 33 35

දෙවිඳාණෝ තම මැවිල්ල සමඟ ජීවත් වන අතර, තම නිර්මාණය පීඩාවට පත් වන සැමවිට ම ඒ වේදනාවට සම්බන්ධ වෙන්නාහ.

- **දෙවිඳුන්ගේ ප්‍රේමය අසීමිත ය.**

ශු. ජොහාන් 3 : 16 , ශු. මතෙව් 6 : 45

ලෝකයේ ගැළවීම උදෙසා තම පුත්‍රයාණන් ව පවා දෙවා වදාළ සේක. එම නිසා ස්වාභාවික ව්‍යසන තුළින් දඬුවම් කිරීමට එතුමන් සූදානම් බව කීම සාවද්‍ය ය.

- **දෙවිඳුන්ගේ කෝපය ස්වාභාවික ව්‍යසන ගෙන දෙමින් ප්‍රකාශ වේ ද?**

ශු. ලූක් 13 : 3 5 , යෙසායා 16 9 , රෝම 12 : 14

සතුරන් වෙනුවෙන් යැදීමට ඉගැන්වූ ප්‍රේමයේ උල්පත වූ දෙවිඳුන් සුනාමිය වැනි ව්‍යසන තුළින් අහිංසක දරුවන් අතුළු මිනිසුන් විනාශකර දමයි යන පදනමට පැමිණිය නොහැකි ය. ඔබ ශු. මතෙව් 13 : 36 43 තේරුම් ගන්නේ කෙසේ ද?

## 2. මැවිල්ල තුළ මිනිසා

- **ස්වාභාවික ලෝකය පිළිබඳ ව දෙවිඳුන්ට වගකියන්නට තිබේ.**

(ගීතාවලිය 8 , උත්පත්ති 1 : 28 )

වගා කිරීම, රැකබලා ගැනීම සශ්‍රීක කිරීම පවත්වාගෙන යාමට අණ ලැබිණි. (උත්පත්ති 2 : 19 20) සතුන්ට නම් පවා තැබුවේ මිනිසා ය.

- **තම කාර්යභාරය නිසිලෙස ඉටුකර යමින් සිටී ද?**

ස්වාභාවික ලෝකයේ නාස්තිය හා විනාශය සිදු වන බව පෙනේ. ( හිරිගල් කැඩීම, ගස් කැපීම ස්වාභාවික වෙරළ විනාශ කිරීම, ලඳු කැපීම්, අනවසර පතල් කැපීම්, නව තාක්ෂණය යටතේ පරිසරය හා සතුන්ට පීඩා වන දේ යොදා ගැනීම, ස්වාභාවික ඇල දොළ ගංගා අපවිත්‍ර කිරීම.) ඉහත කරුණු ස්වාභාවික ව්‍යසන සඳහා ඉතා හොඳින් බලපාන සාධක වෙයි. ස්වාභාවික ලෝකය ආරක්ෂා කිරීම සඳහා අපි උත්සුක විය යුතු වෙමු. ස්වාභාවික ලෝකය ගැන මිනිසුනගේ අවිචාරවත් ක්‍රියා පිළිවෙත්, තමා පිටට ම ඵලවිපාක ගෙන ඒමක් කරයි.

- **ව්‍යසන රජයන ලෝකයක මැවිල්ල පවා ගාවිනා විඳියි**

(රෝම 8 : 20 )

දේව රාජ්‍යයේ පුරවැසියන් හැටියට එහි අගයයන්, ආකල්ප මත ස්වාභාවික ලෝකය සම්බන්ධ ව ක්‍රියා කිරීම කළ යුතු ය. තාක්ෂණික දැනුම පරාර්ථකාමී ලෙස ස්වාභාවික ලෝකය ගොඩනැංවීමට හා රක්ෂා කිරීමට යොදා ගත හැකි ය. වෙනත් රටවල සුනාමිය පිළිබඳ සංඥා කරණකොට ගෙන ජීවිත හානි අවම කර ගැනීමට හැකි විය. වෙනත් රටවල මිනිසා ස්වභාවධර්මය සමඟ ජීවත් වූ නිසා ද විනාශයෙන් ගැළවීමට පහසු විය. නමුත් ශ්‍රී ලාංකික ජනතාව ඉතාමත් ඛේදජනක තත්ත්වයකට පත් විය.

## 3. ස්වාභාවික ව්‍යාසන හමුවේ කිතුනු කාර්යභාරය

- මුල් සභාව මේ සඳහා ආදර්ශයක් වෙයි.

(ක්‍රියා 11 : 28 30 )

ජෙරුසලමේ සාගතයක් ඇති වූ විට එනිනෙකා ව රැකබලා ගනිමින් පෝෂණය කළහ. සංවිධානශීලීත්වයෙන් යුතු ව ඉතා ඉක්මනින් ක්‍රියාත්මක විය.

● **දේශයේ වේදනා විඳින සමයක ඒ සමඟ ජීවත් විය යුතු යි**

(ජෙරමියා 9 : 1 , 1 කොරෙන්ති 1 : 3 4 )

අධික කම්පනයට මුහුණ දී සිටින අය මානසික ව ගොඩනැංවීම බලාපොරොත්තු රහිතභාවයට පත් ව සිටින අය ගොඩනැංවීම, මිත්‍රත්වය, සහෝදරත්වය, සවන්දීම, සැනසීම, උපස්ථානය අනුශාසනාව හා සම්බන්ධතා ගොඩනැංවීම අපගේ යුතුකම යි. බිඳී ගොස් ඇති ඇදහිල්ලේ විශ්වාස තහවුරු කිරීම, යාච්ඤා ජීවිතය ගොඩනැංවීම හා ආත්මික ශක්තිය ඇති කිරීම කළ යුතු යි.

● **පුද්ගලත්වයේ හැඟීම් බර අවස්ථා තුළින් අයුතු ලාභ ගැනීමට ඉඩ නොදීම**

අභ්‍යන්තර කැළඹීම් අවස්ථාවල නව ආගමික විශ්වාස ඇතුළු කිරීම සදාචාර විරෝධී ය. කිතුනු වගකීම පීඩිත ජනතාව ආරක්ෂා කර ගනිමින් කිසිදු ආත්මාර්ථකාමී සැලසුමකට ඉඩ නොතැබීම යි. අනාථ නිවාස / කඳවුරුවල වෙසෙන පුද්ගලයන්ගෙන් අයුතු ලාභ ගැනීමට ඉඩ නොදීම කිතුනු වගකීම යි.

● **ස්වාභාවික ව්‍යසන අපට ඉඟිකරන අනාරක්ෂිතභාවය තේරුම් ගැනීම**

දෙවිඳුන් හා මිනිසා අතර මිනිසා හා පරිසරය අතර ඇති අන්‍යෝන්‍ය සබඳතාවය සුරක්ෂිත කිරීම අවශ්‍ය ය. මේ සබඳතාව රැකීමට ධෛර්ය දීම ව්‍යසන අවම කර ගැනීමට උපකාරී වෙයි. කල් තියා මෙවැනි ව්‍යසන තුළින් විනාශයන් අවම කිරීමට අවශ්‍ය දැනුවත් කිරීමේ සැලසුම් ලබාදිය යුතු ය. එසේ ම ජීවිතයේ අනාරක්ෂිත භාවය හරහා කිතුනුවන්ට නැවත සමිඳුන් වෙත හැරී ධෛර්යමත් වීමට මඟපෙන්වීම හා ව්‍යසන මැද ජීවිතයේ සුරක්ෂිතකම සඳහා දෙවි සමිඳුන් වෙතට කිතුනුවන් ලඟා වීමට අවශ්‍ය ආත්මික මඟ පෙන්වීම ලබා දිය යුතු ය.

● **දේශය වෙනුවෙන් සාමුහික ව යාච්ඤා කිරීම**

අපේ වැඩවලට ශක්තිය ලැබෙන්නේ දෙවිඳුන්ගෙන් ය. අප සමාජ සේවා වැඩවලට යොමු වන්නේ ක්‍රිස්තුස් වහන්සේගේ ගෝලකම තුළිනි. ඒ සඳහා පොළඹවන්නේත් මඟ පෙන්වන්නේත් ශුද්ධාත්මයාණන් ය. එම නිසා සාමුහික යාච්ඤා ජීවිතය ඉතා වැදගත් ය. ( 2 වංශාවලිය 20 : 3 ) දේශය දේශයේ ජනතාව අනාථ නිවාසවල ජීවත්වන අය, සහා සේවාවේ යෙදෙන අය, සංවිධාන ගැන දූෂණ නාස්තිය වැලැක්වීම සඳහා ද දේශපාලන නායකයින් සහ තවත් බොහෝ දේ උදෙසා ද යැදීම අපගේ වගකීම යි.

● **කිතුනුවන් මෙවැනි අවස්ථාවල පරිත්‍යාගශීලී ව ක්‍රියා කළ යුතු යි**

ජාති, කුල, ආගම්, භේදයකින් තොර ව ඒ සඳහා අන් ආගම් හා පුද්ගල සංවිධාන සමඟ කිතුනු අනන්‍යතාවය රකිමින් පරිත්‍යාගශීලිත්වයේ ආත්මයෙන් ඉහළ මට්ටමකින් ක්‍රියා කළ

යුතු යි. මෙසේ දේශය තුළ ස්වාභාවික ව්‍යසන ඇති වන විට අවදි ව ක්‍රියාශීලි ව දේව මග පෙන්වීම තුළ ක්‍රියා කරමින් තමා අවට සමාජය ශක්තිමත් කිරීම ඔබේ වගකීම යි. එවිට මිනිස් පවුල තුළ මානව සබඳතා ඉතා ඉහළ මට්ටමින් සමාජය මත නිරන්තරයෙන් පවතිනු ඇත.

❖ **ඇගැයීම** :-

1. සුනාමි උදම් රළ, ගංවතුර හා නියං සමයක මිනිසුන් සාමූහික ව එකිනෙකා ව රැක ගත යුත්තේ කෙසේද යන්න සාකච්ඡා කරන්න.

2. සුනාමි උදම් රළට හසු වී දිවි බේරාගත් වසර 1 1/2 ක කුඩා දරුවකු රෝහලේ දී සොරාගෙන ගොස් තිබේ.
මේ ගැන පුවත්පතකට ලිපියක් ලියන්න.
ඒ මවගේ / පියාගේ / සොයුරෙකුගේ / සොයුරියකගේ / හැඟීම් ගීයක් / කවියක් ලෙස නිර්මාණය කරන්න.

3. "ස්වාභාවික ව්‍යසන ඇති වන විට එය ක්‍රිස්තුස් වහන්සේගේ දෙවන පැමිණීමට සම්බන්ධ කර පීඩාවට පත්වුවන් කෙරේ තම අවධානය යොමු නොකිරීම සාධාරණ නොවේ සාකච්ඡා කරන්න.